# කෝවිඩ්-19 එන්නත් - සේවකයන් සඳහා රාජකාරී සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ තොරතුරු

## එන්නත ලබා ගන්නා ලෙසට මා හට බල කල හැකිද?

ඔබගේ කැමැත්තට විරුද්ධව ඔබට එන්නතක් ලබා දීම හෝ කිසියම් වෛද්‍ය ක්‍රියාපටිපාටියකට හෝ යටත් කිරීම කල නොහැක.

කෙසේ වුවද, සමහර අවස්ථාවල වැඩි අවදානම් සහිත කමර්ාන්තයක නියලී සිටින විට මහජන සෞඛ්‍ය නියෝග මගින් එසේ ඉල්ලා සිටිය හැක. ඔබගේ සෞඛ්‍ය ඒජන්සියේ යාවත්කාලීන උපදෙස් ලැබෙන තෙක් බලා සිටින්න.

## රාජකාරී සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ නීති යටතේ මාගේ සේවායෝජකයා විසින් මා හට කෝවිඩ්-19 ආසාදනයට එරෙහිව එන්නත් කර ගන්නා ලෙස ඉල්ලා සිටිය හැකිද?

බොහෝ සේවකයන් සම්බන්ධයෙන් රාජකාරී සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ නීති යටතේ ඔබ විසින් එන්නත ලබා ගන්නා ලෙස ඉල්ල සිටීම කල නොහැක.

කෙසේවුවද මෙයට ව්‍යාතිරේක ඇත. එනම් ඔබ වැඩි අවදානමක් ඇති කමර්ාන්තයක රාජකාරියේ නිරතවී සිටින අවස්ථාවක. ඔබට එන්නත් ලබා ගැනීම අවශ්‍ය වන මහජන සෞඛ්‍ය නියෝග ඇත.

ඔබගේ සේවායෝජක විසින් ඔබ එන්නත් ලබා ගැනීම අවශ්‍ය වන අවස්ථාවක, ඔවුන් විසින් ඔබට දැනුවත් තීරණයක් ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දිය යුතුය. ඔබට ගැටළුවක් ඇතිනම්, ඔබගේ පවුලේ වෛද්‍යවරයා සමඟ සාකච්ඡා කරන්න. ඔබගේ රාජකාරී සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ නියාමක, සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ නියෝජිත හෝ සේවක සංවිධාන සමඟ උපකාර සඳහා සම්බන්ධ වන්න.

වැඩිදුර විස්තර සඳහා ෆෙයාර් වකර් ඔම්බඩ්ස්මන් සමඟ කථා කරන්න.

## සෞඛ්‍යය සහ ආරක්ෂාව සම්බන්ධ නීති යටතේ මාගේ වගකීම කුමක්ද? මෙයින් අදහස් වන්නේ මා විසින් එන්නත ලබා ගත යුතු බවද?

සේවකයෙකු වශයෙන්, ඔබගේ සෞඛ්‍ය සම්බන්ධයෙන් නිසි අවදානමෙන් කටයුතු කල යුතු අතර, රාජකාරියේ සිටින අනෙක් අයගේ සෞඛ්‍යය සහ ආරක්ෂාවට අහිතකර ආකාරයට බලපාන කිසිදු දෙයක් ඔබ විසින් සිදු නොකල යුතුය. ඔබගේ සේවායෝජක විසින් ලබා දෙන සාධාරණ සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ උපදෙස් ඔබට හැකි ආකාරයට අනුගමනය කල යුතුය.

ඔබ විසින් එන්නත ලබා ගැනීම සම්බන්ධ නීතියක් හෝ මහජන සෞඛ්‍ය නියෝගයක් ඇතිනම්, එම කමර්ාන්තයේ නියලී වැඩ කිරීමට, හෝ දිගටම වැඩ කිරීම සඳහා එන්නත ලබා ගැනීම අවශ්‍ය විය හැකිය.

## මාගේ සේවා ස්ථානයේ එන්නත ලබා ගැනීම අවශ්‍ය වන්නේ නම්, මාගේ සේවායෝජක මා සමඟ ඒ සම්බන්ධයෙන් කථා කිරීම අවශ්‍යවේද?

ඔව්. ඔබගේ සේවායෝජක විසින් අනිවාර්‍ය එන්නත් ප්‍රතිපත්තියක් සලකා බලන්නේ නම්, එසේ කිරීමට පෙර, ඔවුන් විසින් ඔබගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ නියෝජිතගේ අදහස් විමසීමක් කල යුතුය. ඔබ විසින් එන්නත ලබා නොගැනීමට හේතුවක් ඇතිනම්, එම හේතුව ලබා දිය යුතුය.

## මා හට එන්නත ලබා දී ඇත. මා විසින් තව දුරටත් භෞතික දුරස්ථශාවය සහ අත් සේදීම වැනි වෙනත් පූවර්ාරක්ෂණ ක්‍රියා මාගර් ගත යුතුද?

ඔව්. ආරක්ෂාකාරී සහ සඵලදායී එන්නත, ප්‍රජාව ආරක්ෂාකාරීව සහ සෞඛ්‍යය සම්පන්නව තබා ගැනීමේ එක් අංගයක් පමණි. කෝවිඩ්-19 ව්‍යාප්තවීම වළක්වා ගැනීම සඳහා පහත ක්‍රියා මාගර් දිගටම අනුගමන කරන්න:

- මහජන සෞඛ්‍ය නියෝග පිළිපදින්න
- ඔබට අසනීප නම්, කෝවිඩ්-19 රෝග ලක්‍ෂණ ඇතිනම් හෝ සෞඛ්‍ය බලධාරීන් විසින් ඔබට නිවසේ රැඳී සිටීමට උපදෙස් දී ඇතිනම්, රාජකාරියට නොයන්න
- කෝවිඩ්-19 ආසාදනයෙන් බේරීම සඳහා ඇති භෞතික දුරස්ථශාවය සහ පිරිසිදු කිරීම ඇතුළු ආරක්‍ෂාකාරී ආකාරයට රාජකාරී කල හැකි සියළුම දේ සිදු කරන්න
- උපදෙස් පිළිපදින්න
- ආරක්‍ෂාකාරී ආකාරයට රාජකාරී ඉටු කිරීම පිළිබඳ සැකයක් ඇතිනම් ඒ බව අසා දැන ගන්න
- අත් වැසුම් පැළඳීම වැනි පුද්ගලික ආරක්‍ෂක උපකරණ (personal protective equipment (PPE)) භාවිතා කිරීම ඔබට පුහුණුව ලබා දී ඇති ආකාරයට සිදු කරන්න
- කිසියම් අනාරක්ෂිත තත්වයක් ඇතිනම්, ඔබග් සුපවයිසවර්රය හෝ සෞඛ්‍ය සහ ආරක්‍ෂක නියෝජිතයා වෙත වාතර්ා කරන්න

## වැඩිදුර තොරතුරු

- සෞඛ්‍ය සහ එන්නත් තොරතුරු - සෞඛ්‍ය දෙපාතර්මේන්තුව
- රාජකාරී සෞඛ්‍ය සහ ආරක්‍ෂාව - සේෆ් වකර් ඕස්ට්‍රේලියා
- සේවා ස්ථාන අයිතිවාසිකම් - ෆෙයාර් වකර් ඔම්බඩ්ස්මන්